# දෙවියන් බඹුන් මැරිය හැකි ද?

බටහිර ජීව විද්‍යාවෙහි ජීවීන් යනුවෙන් හැඳින්වෙන්නන් අපට ද කොටස් දෙකකට බෙදිය හැකි බව අපි දුටුවෙමු. ඒ සත්ත්වයන් හා පැලෑටි යන ආකාරයෙන් නො වෙයි. සාමාන්‍යයෙන් උද්භිද විද්‍යාව හා සත්ත්ව විද්‍යාව යනුවෙන් හැඳින්වෙන්නේ පිළිවෙලින් එසේ පැල හා සතුන් පිළිබඳ අධ්‍යයනය කෙරෙන විද්‍යාවන්ට ය. එහෙත් අප සත්ත්වයකු යැයි කියන්නේ භවයෙන් භවයට යම් ප්‍රමාණයකින් තම තොරතුරු වෙනස්කරමින් ගෙනයන්නකුට ය. අපේ සත්ත්වයා ජීවියකුවීම අනිවාර්ය නොවෙයි. ජීවීහු යනු ගස්වැල් හා අප සාමාන්‍යයෙන් පණ ඇති සතුන් ලෙස හඳුන්වන්නෝ වෙති. ඔවුහු පරම්පරාවෙන් පරම්පරාවට, දෙමව්පියන්ගෙන් දරුවන්ට ආදී වශයෙන් තොරතුරු ගෙනයති. දෙවියෝ ද සත්ත්වයෝ වෙති. එහෙත් ඔවුහු ජීවීහු නො වෙති.

අප ජීවීන් කොටස් දෙකකට බෙදන්නේ ප්‍රාණීන් හා අප්‍රාණීන් යනුවෙන් ය. ප්‍රාණීහු යනු සත්ත්වයන් වූ ජීවීහු වෙති. ප්‍රාණියකු වීමට ජීවියකුට අමතරව සත්ත්වයකු ද විය යුතු ය. එමෙන් ම ජීවීන් නොවන සත්ත්වයෝ ද වෙති. දෙවියෝ යනු ජීවීන් නොවන සත්ත්වයෝ වෙති. ජීවීන් නොවන යන්නෙන් මෙලොව හෝ වෙනත් තැනක හෝ භවයක නොවන අර්ථයක් නො ලැබෙයි. කලින් සඳහන්කර ඇති ආකාරයෙන් අප පන්සිල් සමාදන්වීමේ දී කියන්නේ පණ ඇති සතුන් මැරීමෙන් වළකිමි යන්න ය. ප්‍රාණීන් නොවන සත්ත්වයන් අපට එදිනෙදා ජීවිතයේ දී මුණ නොගැසෙන බව සැබෑ ය. එබැවින් එවැන්නන් මරාදැමීම පිළිබඳ ප්‍රශ්නයක් ඇති නොවෙයි. එහෙත් මෙහි තවත් පැත්තක් ද වෙයි.

ප්‍රාණීන් නොවන සත්ත්වයන් මරාදැමිය හැකි ද? අපට මුණගැසුණත් දෙවියකු හෝ ප්‍රේතයකු හෝ මරාදැමිය හැකි ද? දෙවියන් හා ප්‍රේතයන් වැනි සත්ත්වයන් මරාදැමීම කෙසේවෙතත් ඔවුන් මියයන්නේ ද? දෙවියන් චුතවනු මිස මියනොයන බවක් අප සාහිත්‍යයෙහි සඳහන්වෙයි. මියයන්නේ හෝ මරාදැමීමට ලක්වන්නේ හෝ ජීවීන් පමණ ද? කෙසෙල් ගසක් මිය යා හැකි ය. අවශ්‍ය නම් කෙසෙල් ගසක් මරාදැමිය හැකි ය. එහෙත් කෙසෙල් ගසක පණ නොයයි. අපි පන්සිල්ගැනීමේ දී කෙසෙල් ගස් නොමැරීමට පොරොන්දු නො වෙමු. ඒ කෙසෙල්ගස ජීවියකු වුව ද ප්‍රාණියකු නොවන බැවින් ය.

අප කතාකරන භාෂාවේ අපේ සංස්කෘතියෙහි ඇති බොහෝ ගුණ අඩංගු වෙයි. අප අවිඥානිකව ම අපේ විද්‍යාවක සංකල්ප යොදාගන්නා බව පැහැදිලි විය යුතු ය. මේ සංකල්ප පිළිබඳ ව සවිඥානික ව අධ්‍යයනයකිරීම අපේ වගකීමක් වෙයි. පණ ඇති සතුන් මැරීමෙන් වළකිමි යන වාක්‍යයෙහි සත්ත්වයන් පිළිබඳ අප සංස්කෘතියෙහි ඇති වර්ගීකරණයක් ද වන බව තේරුම්ගැනීම අප කාට කාටත් වැඩදායක වෙයි. පණ නැති සත්ත්වයන් මියනොයන හෙයින් මරාදැමීමට ද නොහැකි වන අතර පණ නැති කෙසෙල් ගස් වැනි ජීවීන් මරාදැමීමෙන් අකුසලයක් ද නො සිදුවෙයි.

එහෙත් මෙවැනි කරුණු සඳහන්කරන විට බටහිර විද්‍යාව යම්තමින් කටගාගත් අයට ප්‍රශ්න ඇතිවන බව ද අපි දනිමු. ලංකාවේ කිසිම විශ්ව විද්‍යාලයක බටහිර විද්‍යාව හෝ බටහිර ගණිතය හෝ උගන්වන්නකු විසින් පමණක් නොව ලංකාවෙන් ගොස් බටහිර විශ්ව විද්‍යාලයක ඒ විෂය උගන්වන කිසිවකු විසින් හෝ දැනුමට තමාගේම යැයි කිවහැකි වැදගත් එකතුවක් කර නැති විටක, මෙරට සිටින බටහිර විද්‍යාව කටගාගත්තවුන්ගේ ප්‍රශ්න ඔවුන්ගේ ස්වාමිවරුන් ඔවුන් ලවා අස්සවන ප්‍රශ්න මිස ඔවුන්ගේ නිර්මානාත්මක ප්‍රශ්න නොවන බව ද අපි දනිමු. ඔවුන්ගේ බටහිර ස්වාමිවරුන් ඔවුන් ලවා ප්‍රශ්න අස්සවන්නේ කෙසේදැයි ඇතැම්විට යම් අයකුට ප්‍රශ්නයක් විය හැකි ය. ඒ ප්‍රශ්න බටහිර ස්වාමිවරුන්ගේ ප්‍රශ්න වන්නේ කෙසේ ද යන්න ද ප්‍රශ්නයක් විය හැකියැයි සිතමි.

එයට එක එල්ලේම දිය හැකි පිළිතුර නම් එලෙස ප්‍රශ්නයක් ඇසීමට තරම් නිර්මානශීලීත්වයක් ඔවුන්ට නැතිවීම ය. ඔවුන්ගේ බටහිර ස්වාමිවරුන් අසන ප්‍රශ්න ඔවුන්ට අධ්‍යාපනය මගින් පාසල් හා විශ්වවිද්‍යාල ඔස්සේ ලැබෙයි. උදාහරණයක් ලෙස ගතහොත් පණ නැති සත්ත්වයන් ලෙස දෙවියන් ආදීන් ඇති බව අප දන්නේ කෙසේ දැයි යමකු

© Prof. Nalin De Silva

ප්‍රශ්නකිරීමට ඉඩ ඇත. අපට නොපෙනෙන ඉන්ද්‍රිය ගෝචර නොවන සත්ත්වයන් ගැන අප විශ්වාසකරන්නේ කෙසේද යන්න ප්‍රශ්නයක් වනු ඇත.

අප සතුව ඇත්තේ විශ්වාස හා උපකල්පන පමණක් යැයි ඔවුන් කියනු ඇත. එහෙත් ඔවුන් නොසලකන පැත්තක් ද වෙයි. එනම් බටහිර විද්‍යාවේ ප්‍රවාද ගොඩ නැගෙන්නේ දෙවියන් බඹුන් ආදී වශයෙන් වූ සත්ත්වයන් නොමැති යැයි හා මේ භවයට පළමු අපට වෙනත් භවයක් නොතිබිණි යැයි උපකල්පනය කරමින් බව ඔවුන්ට අමතක වීම ය. කිසිම ප්‍රබුද්ධයකුට  බටහිර විද්‍යාවේ එවැනි උපකල්පනයක් ඇති බවක්වත් කල්පනා නො වෙයි. බටහිර ජීව විද්‍යාවේ හෝ ඒ මත පදනම් වූ තාක්ෂණය වූ බටහිර වෛද්‍ය විද්‍යාවේ හෝ පමණක් නොව බටහිර මනෝ විද්‍යාවේ, මනෝ විශ්ලේෂණයේ හෝ වෙනත් බටහිර විද්‍යාවක හෝ තාක්ෂණයක හෝ ප්‍රවාද ගොඩනැගීමේ දී අපේ පෙර භවයක පුරුදු කෙසේ බලපාන්නේ ද යන්න සාකච්ඡා නො වෙයි.

එසේ සාකච්ඡා නොවන්නේ එලෙස පෙර භවයක් නැතැයි යන උපකල්පනයේ පිහිටමින් ය. එය උපකල්පනයක් නොවේ යැයි කිසිවකුටවත් කිව නො හැකි ය.  ඒ උපකල්පනයක් නොවේ නම් ඒ බව තහවුරු කළ යුතු ය. එනම් පෙර භවයක් නොමැති බව ඔවුන්ගේ ම ඊනියා විද්‍යාත්මක විධික්‍රමය යොදාගෙන පෙන්වා දිය යුතු ය. එය පෙර භවයක් ඇති බව ඊනියා විද්‍යාත්මක විධික්‍රමය යොදාගැනීමෙන් පෙන්වා දෙන ලෙස කරන ඉල්ලීමකට වඩා වෙනස් වෙයි.

බටහිර විද්‍යාවට අනුව පෙර භවයක් ඇතැයි පෙන්වන්නට යන හෝ ඒ බව පෙන්වා ඇතැයි හෝ කියන ඕල්කට් බෞද්ධයෝ වෙති. මෙහි දී අප සඳහන්කරන්නේ එවැන්නන් ගැන හෝ එවැන්නන්ගේ ව්‍යායාමයන් ගැන හෝ නො වෙයි. පෙර භවයක් ඇතැයි යන්න හුදු උපකල්පනයක් පමණක් යැයි කියමින් එවැනි උපකල්පන මත පදනම් ව මතවාද (ප්‍රවාද, බටහිරයන් තමන්ගේ නොවන ප්‍රවාදවලට කියන්නේ මතවාද කියා ය.) ගොඩනැගීම ඇතැයි කියන විද්‍යාත්මක ක්‍රමයකට පටහැණි යැයි කියමින් බටහිර විද්‍යාව පසුපස යන්නන්ගේ ඊනියා ප්‍රබුද්ධ සටන්පාඨ අපේ අවධානයට ලක්වෙයි. මේ සටන්පාඨවලින් කියැවෙන්නේ පෙර භවයක් ඇතැයි කියන්නවුන් ඒ බව බටහිර විද්‍යාවට අනුව පෙන්නුම් කළයුතු බව ය.

එහෙත් පෙර භවයක් ඇතැයි කියන්නවුන් වෙනත් අයගේ අවශ්‍යතා හා නිර්ණායක මත තම දැනුම තහවුරු කළයුත්තේ ඇයි? එයට කිසිම පදනමක් නැත. පෙර භවයක් ඇතැයි කියන්නවුන් ඔවුන්ගේ අනෙක් දැනුම් සමග සංගතවන අයුරින් (පරස්පර නොමැතිවන අයුරින්) පෙර භවය පිළිබඳ දැනුම යොදාගන්නේ නම් ඒ ප්‍රමාණවත් ය. මෙහි දී වරදක් කෙරෙන්නේ බටහිර විද්‍යාඥයන් අතින් ය. ඔවුහු පෙර භවයක් නැතැයි උපකල්පනය කරමින් තම ප්‍රවාද ගොඩනගති.  පෙර භවයක් නැතැයි යන උපකල්පනය බටහිරයන් ලබාගන්නේ කෙසේ ද? බටහිර විද්‍යාඥයන්ට තම ප්‍රවාද යොදාගනිමින් පෙර භවයක් නැතැයි නිශ්චිතවම පෙන්විය හැකි ද? හැකිනම් තම ප්‍රවාද මත පමණක් සිට පෙර භවයක් හා පසු භවයක් හා සාධාරණ වශයෙන් ගත්කල සංසාරයක් නැතැයි සාධනයකිරීමට බටහිර විද්‍යාඥයන්ට අපි අභියෝග කරන්නෙමු. තම පද්ධතියෙහි උපකල්පන ඒ පද්ධතිය ඇසුරෙන්ම තහවුරු කිරීම වෙනුවට වෙනත් අය පදනම්වන ප්‍රකාශ තම පද්ධතිය ඇසුරෙන් පෙන්වන ලෙස බටහිර විද්‍යාඥයන් කරන ඉල්ලීමෙන් පෙන්නුම්කෙරෙන්නේ බටහිර විද්‍යාඥයන් තම ආධිපත්‍යය පතුරවන ආකාරය ය. අපේ ප්‍රකාශ අපේ පද්ධතියෙහි නම් සංගතවන බව අපි කියමු.

අප සාකච්ඡාකරන්නේ මූලික වශයෙන් ගත්කල මතකය පිළිබඳව ය. මතකයට අවශ්‍ය තොරතුරු ය. එහෙත් ඒ හුදෙක් තොරතුරු ගබඩාකිරීමක් පමණක් නො වෙයි. ගබඩාකරන ලද තොරතුරු නැවත ආපසු ලබාගැනීම ද මතකයට අවශ්‍ය වෙයි. තොරතුරු ගබඩාකිරීම හෙවත් රැස්කිරීම පමණක් මගින් මතකයක් ඇතිකරගත නො හැකි ය. පරිගණකයෙහි මතකය ගැන අපි කතාකරමු. පරිගණකයෙහි ද දත්ත රැස්කිරීම පමණක් නොව දත්ත ආපසු ලබාගැනීම ද  සිදුවෙයි. වී ඇටයක අඩංගුවන දත්ත ද ආපසු ලබාගැනීමට නැත්නම් කැඳවීමට හැකියාවක් වෙයි. එසේ ආපසු ලබාගැනීමට හැකියාවක් නොමැති නම් වී ඇටය වැපුරුකල පැලවීමට ඉඩක් නොමැත. එසේම එහි අඩංගු තොරතුරු ගොයම් පැලයට ලබාදීමේ හැකියාවක් ද නැත.

එහෙත් මෙහි දී ප්‍රශ්නයක් වනුයේ වී ඇටය මේ ක්‍රියාවලිය පිළිබඳ දැනුවත් ද යන්න ය. වී ඇටයට අවශ්‍ය තෙතමනය ආදිය ලැබුණු විට ඉන් මුල් ඇදීමටත් ඉන්පසු දළුදැමීමටත් පටන්ගැනෙයි. මෙය හුදෙක් පොල්ගෙඩියක් අතහැරි කල

© Prof. Nalin De Silva

පොළොවට වැටීම වැනි ක්‍රියාවක් ද, එසේත් නැත්නම් මිනිසකු දැනුවත් ව සිදුකරන ක්‍රියාවක් වැන්නක් ද? අප මේ ප්‍රශ්නයට පිළිතුරක් ලබාගන්නේ කෙසේ ද?

ඒ ප්‍රශ්නය විසඳීමේ දී යොදාගත හැකි නිර්ණායකයක් නම් වී ඇටයට අවශ්‍ය නම් නොපැලවී සිටිය හැකි ද යන්න ය. පොල්ගෙඩියක් අතහැරිකල එයට නොවැටී සිටිය හැකි ද? පොල්ගෙඩිය ගුරුත්වය යටතේ පොළොවට ළඟාවීම හැරෙන්නට පොල්ගෙඩියට කළ හැකි අන් දෙයක් නැත. පොල්ගෙඩියට අත්තක් අල්ලාගත හැකි නො වෙයි. එහෙත් මෙහි දී කිසිවකුට කිව හැක්කේ මිනිසකු උසකින් අත්හැරි කල්හි ද ඔහුට වැටෙනු හැරෙන්නට වෙනත් කළ හැකි දෙයක් නොමැති බව ය. එය බොහෝ දුරට එසේ යැයි කිවහැකි නමුත් මිනිසකුට ළඟ ඇති ගසක හෝ ඒ ගසෙහිම හෝ අත්තක එල්ලීමට හැකි වෙයි. අඩුම තරමින් මිනිසාට එලෙස අත්තක එල්ලීමට සිතක් හෝ පහළ වෙයි. එහෙත් පොල් ගෙඩියට  එවැනි අදහසක් සිතෙහි පහල නො වෙයි. පොල් ගෙඩියට කළ හැකි එකම කාරයය නම් පොළොවේ ගැටෙන තෙක්  දිගින් දිගට ම පොළොව ආසන්නයේ දී චලනය වීම ය.

වී ඇටයකට ද, එය බොල් නො වේ නම් අවශ්‍යතා සම්පූර්ණ වූ පසු පැල නොවී සිටිය නො හැකි ය. එමෙන් ම අවුරුදු සියයක් ගිය ද වී ඇටයේ තොරතුරු විනාශ  නොවී ඇත්නම් එයට සුදුසු අවශ්‍යතා ලැබුණු පසු ඒ පැලවීමට පටන්ගනියි. සත්ත්වයකු නොවූ ජෛව වස්තුවලට ට හෝ ද්‍රව්‍යවලට හෝ කළ හැක්කේ අනෙක් වස්තුවලට (හා විද්‍යුත් චුම්බකත්වයේ දී ක්ෂේත්‍රවලට) ප්‍රතිචාර  දැක්වීම පමණක් වෙයි. ඒ ප්‍රතිචාරය කලින් කිවහැකි වෙයි. එහෙත් පණ ඇති සත්ත්වයෝ ඒ අනෙක් වස්තුවල ක්‍රියාකාරකම්වලට එරෙහිව ද ප්‍රතිචාර දක්වති. ඒ ප්‍රතිචාරය කුමක් දැයි කලින් කිවහැකි නො වෙයි. ඇතැම් විට ක්වොන්ටම් යාන්ත්‍රිකයෙහි මෙන් ප්‍රතිචාරය අසවල් එක වීම සඳහා මෙපමණ සම්භාවිතාවක් ඇතැයි කීමට නම් කිසිවකුට හැකියාවක් තිබීමට ඇත.

**මහාචාර්ය නලින් ද සිල්වා**

© Prof. Nalin De Silva